# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - නර්තන හා නාට්‍ය කලා පීඨය
# නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය

## උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය - 2025

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශයෙහි ප්‍රධාන උපාධි පාඨමාලා 03 ක් ක්‍රියාත්මක වේ. **(01) රූපණය, (02) නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය,** හා **(03) මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය** එම පාඨමාලා වේ. උසස් පෙළ නාට්‍ය හා රංග කලාව විෂය හදාරා ඇති අපේක්ෂකයන්ට රූපණය සහ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය යන පාඨමාලා දෙකට ම අයදුම් කළ හැකි අතර මුද්‍රානාට්‍ය හා නූතන නර්තන පාඨමාලාවට අයදුම් කළ හැක්කේ උසස් පෙළ නාට්‍ය හා රංග කලාව සහ නර්තනය යන විෂයයන් ද්විත්වය ම හැදෑරූ අපේක්ෂකයන්ට පමණි. අපේක්ෂකයන්ට තමන්ට අභිමත පාඨමාලා සඳහා අයදුම් කළ හැකි අතර, ඉහත සඳහන් පාඨමාලා ත්‍රිත්වයට ම අයදුම් කර පෙනී සිටියහොත්, අපේක්ෂකයා විසින් වැඩි පරිසාධිතබවක් පෙන්නුම් කරන ලද විෂය මාලාව සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබේ.

- **යෝග්‍යතා පරීක්ෂණයේ ස්වභාවය කෙබඳුද?**

මෙම යෝග්‍යතා පරීක්ෂණය, ඉහත සඳහන් උපාධි පාඨමාලා අරමුණු කරගත් **ලිඛිත පරීක්ෂණයකින්, ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සහතික පත්‍ර ඇගයීමකින්** සමන්විතය. ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය දින දෙකක දී පැවැත්වෙන අතර සහතික පත්‍ර පරීක්ෂාව තමන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ දිනයේ දී ම සිදු වේ.

එක් එක් පාඨමාලා සඳහා නිර්දේශිත පරීක්ෂණ පහත දැක්වේ.

- **රූපණය සහ/හෝ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය පාඨමාලා සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| රූපණය හෝ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා දෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින්ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතුන් නිසාද යන්න වාචික ව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 02<br><br>ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය / ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනය අවසානයේ නිර්දේශිත ඒකල භාෂණ අමුණා ඇත) | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 03<br><br>එසැණ නිරූපණය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව තෝරා ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 04<br><br>නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණයද සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pen drive එකක රැගෙන ආ යුතුය.)<br><br>මෙම ඇගයීමේදී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායන සමඟින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | 10% |

| | | |
|---|---|---|
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| | **මුළු ලකුණු** | **100%** |

- **මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය පාඨමාලාව සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා දෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු කොටස සඳහා ලකුණු 10 ක් ද, දෙවන කොටස සහ තෙවන කොටස සඳහා ලකුණු 15 බැගින් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතුන් නිසාද යන්න වාචිකව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 02<br><br>නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රානාට්‍ය හෝ නව නිර්මාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතුය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රා නාට්‍යයට අමතරව බටහිර බැලේ (ballet), නිදහස් චලන නර්තන (freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (musical choreography) යනාදී ඕනෑම ශෛලියක ආභාසය ලබා ගත හැකිය.<br><br>(නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pen drive එකක රැගෙන ආ යුතුය)<br><br>නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුෂලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ. | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 03<br><br>ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂිය/ඒකල භාෂිය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමගින් ඉදිරිපත් කළ යුතුය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත එකල භාෂණ අමුණා ඇත) | 10% |

| | | |
|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය: 04<br><br>එසැණ නර්තනය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>(මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| **මුළු ලකුණු** | | **100%** |

- **රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ/හෝ මුද්‍රා නාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වයම සඳහා අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ/හෝ මුද්‍රා නාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වයම සඳහා ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබාදෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින්ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයः 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතූන් නිසාද යන්න වාචිකව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණයः 02.1<br><br>ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය/ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමගින් ඉදිරිපත් කළ යුතුය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත එකල භාෂණ අමුණා ඇත) | 20%<br><br>(මෙම කොටස් දෙකම අනිවාර්ය ඉදිරිපත් කිරීම් වන අතර මෙම ඉදිරිපත් කිරීම් දෙකෙන් වඩාත් පරිසාධිත මට්ටමක් නිරූපණය කරන අංගය සඳහා ලකුණු හිමි වේ.) |
| ප්‍රායෝගික පරීක්ෂණයः 02.1<br><br>නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රා නාට්‍ය හෝ නව නිර්මාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතුය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රා නාට්‍යයට අමතරව බටහිර බැලේ (Ballet), නිදහස් චලන නර්තන (Freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (Musical choreography) යනාදී ඕනෑම ශෛලියක ආභාසය ලබා ගත හැකිය.<br><br>(නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pen drive එකක රැගෙන ආ යුතුය.) | |

| | | |
|---|---|---|
| | නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුෂලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ. | |
| ප්‍රායෝගික පරීක්ෂණයඃ 03<br><br>එසැණ නිරූපණයක්<br><br>**හෝ**<br><br>එසැණ නර්තනයක් | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව කේන්ද්‍ර කර ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ.<br><br>**හෝ**<br><br>ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>(මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| ප්‍රායෝගික පරීක්ෂණයඃ 04<br><br>නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණයද සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pen drive එකක ආ යුතුය.)<br><br>මෙම ඇගයීමේදී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායන සමඟින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | 10% |
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| | **මුළු ලකුණු** | **100%** |

- **පරීක්ෂක මණ්ඩලයේ ලකුණු ගණනය වන්නේ කෙසේද?**

මෙම අභියෝගතා පරීක්ෂණයේ පරීක්ෂක මණ්ඩලය, අභ්‍යන්තර කථිකාචාර්යවරුන්, බාහිර කථිකාචාර්යවරුන් සහ විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විතය. අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ප්‍රධානය කෙරෙන්නේ අදාළ පරීක්ෂණයේ එක් එක් කොටස් සඳහා පිරිනමන ලකුණුවල එකතුවක් ලෙසය.

- **ඔබ යෝග්‍යතා පරීක්ෂණය සඳහා සූදානම් වීමේදී සැලකිය යුතු වෙනත් කරුණු මොනවාද?**

  - ඔබගේ ඉදිරිපත් කිරීම් නිසි ලෙස පුහුණු කළ යුතුය.
  - ඔබට ලබා දී ඇති නාට්‍ය පෙළ සහ ගීත ආදිය තම **මතකයෙන් ඉදිරිපත් කළ යුතුය.**
  - ඔබේ රංගය සඳහා රංග වස්ත්‍ර හා අංගරචනා අපේක්ෂා නොකෙරේ. පහත පෙන්වා දී ඇති ආකාරයේ කළු හෝ තද පැහැති පුහුණු ඇඳුමක් පමණක් ප්‍රමාණවත් වේ.



  - රංගයට අත්‍යාවශ්‍ය නම් පමණක් සරල රංග භාණ්ඩයක් භාවිත කළ හැකිය.

- **පරීක්ෂණයෙන් ප්‍රතික්ෂේප වීමට හෝ ඇගයීම අත්හිටුවීමට හේතු මොනවාද ?**

  - අයදුම් කරන්නා වෙනුවට ව්‍යාජ ලෙස වෙනත් අයෙකු පෙනී සිටීම.
  - නිර්දේශිත ඇගයීම් කණ්ඩ සඳහා නිසි ලෙස සූදානම් වී නොමැති වීම.

**ඔබේ යෝග්‍යතා පරීක්ෂණය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: https://vpa.ac.lk**

# **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිර්දේශිත ඒකල භාෂණ**

නිර්දේශ කරනු ලබන කේවල භාෂීය / ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් (කට පාඩමින්) ඉදිරිපත් කළ යුතුය.

## The Caucasian Circle by Bertolt Brecht

**හුණු වටයේ කතාව**
**පරිවර්තනය- හෙන්රි ජයසේන**
**චරිතය - කෝපරල් (පිරිමි)**

කෝපරල් : උඹ කවදාවත් මිනිහෙක් වෙන්නෙ නෑ මී හරකා. උඹට කිසි සතුටක් නෑ කරන වැඩේ ගැන. උඹේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට පේනව ඔය ඔක්කොම පොඩි පොඩි දේවලින්. ඊයෙ මං අර මහත කෙල්ලගේ මූණ ඉඹින වෙලාවෙ මම අණ කළ විධියට උඹ ඒකිගේ මිනිහගෙ කකුල් දෙකෙන් අල්ල ගත්තා තමයි. බඩටත් පයින් එකක් ඇන්න තමයි! නමුත් නියම පක්ෂපාත සුළු සෙබළෙක් හැටියට සන්තෝෂෙන් ද උඹ ඒක කළේ? ගොන් බාස්, මම හොඳට උඹේ ඉරියව් බලා ගෙනයි ඉන්නේ! උඹ නිකම් හුළං බටයක්! හිස් බෙලෙක්කයක්! උඹට නම් හම්බ වෙන්නේ නෑ උසස් වීමක් කවදාවත්.

(ඔවුහු මඳ වේලාවක් නිශ්ශබ්දව ගමන් කරති.)

උසස් නිලධාරියෙක්ය කියල උඹෙ කිසිම ගරු සරුවක් නෑ! මට හොඳට පේනව ඒක. මොකද ඔය කොර ගහන්නෙ? මම අණ කරනව උඹට කොර ගහන්න එපාය කියල. උඹ ඔය කොර ගහන්නෙ මම අශ්වයන් විකුණපු නිසා නේ! මොකද මං උන්ව වික්කෙ? කවදාවත් එහෙම ගණනක් ලැබෙනව ද අශ්වයෙකුට? උඹ ඔය කොර ගහන්නේ උඹ පයින් යන්න කැමති නැති බව මට අඟවන්න. මම දන්නව උඹව හොඳට හිටපන් උඹ! මොකද කට පියා ගෙන යන්නෙ? කියපන් සින්දුවක්.

**Widows by Ariel Dorfman**

**වැන්දඹුවෝ**
**පරිවර්තනය- සිරිල් සී. පෙරේරා**
**චරිතය - මැද කපිතාන් (පිරිමි)**

(ගැහනුන් අමතන නියායෙන් කපිතාන් වේදිකාව සිට ප්‍රේක්ෂකයින් අමතයි)

මැද කපිතාන් : සහෝදරයිනි. අපේ නගරවල හා කඳු මිටියාවත්වල මෙතෙක් කල් පැවතුණු යුද්ධය අවසන් වී දැන් සාමය උදා වී තියෙනවා. දැන් ඉතින් අප විසින් කළ යුතුව තිබෙන්නේ අපේ රටට සමෘද්ධිය ළඟා කර දෙන නියම සාමය ගොඩනැඟීමේ ජාතිත කර්තව්‍යයට උර දීමයි. නමුත් සමහරුන්ගේ සිත් තුළ තවමත් යුද්ධමය මානසිකත්වය පවතිනවා. මේ යුද්ධය නිසා අප සියලු දෙනාටත්, මේ රටටත් ජනතාවටත්, අපේ හමුදාවටත්, ආර්ථිකයටත්, විශාල හානියක් සිද්ධවුණා. ඒ නිසා දැඩි පියවරවල් ගැනීමට අවශ්‍යයි. සමෘද්ධිමත් අනාගතයක් ගොඩනැඟීමේ අධිෂ්ඨානය සහ ධෛර්ය ඇති අය මේ ජාතික කර්තව්‍යයට උර දීමට සූදානමින් සිටිනවා. නුඹලා ද ඊට සහයෝගය දෙන්නේ නම් මෙතෙක් කල් නුඹලා අපට දැක් වූ එදිරිවාදිකම්, හා කළ විනය විරෝධී වැඩ අමතක කරන්න අපි සූදානම්. නුඹලා අතීතය අමතක කොට අප සමඟ එක් වන්නේ නම් අන්තිමේ දී සිදු වූ මේ තුවාල සුව වෙනවා නියතයි. නුඹලාගේ දිළිඳුකම, මන්දගාමී බව, නැති කිරීමට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය හා තාක්ෂණය මේ රටට ගෙනෙනවා ඇති. පෝර නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදි වෙනවා ඇති. සත්ව පාලනය දියුණු කරනවා ඇති. කෘමිනාශක නිෂ්පාදන කරනවා ඇති. පුස්තකාල විවෘත කරනවා ඇති. අලුත් ජනතාවක් වෙනුවෙන් අලුත් රටක් බිහි වෙනවා ඇති. නුඹලා අපට සහයෝගය දෙන්නේ නම් නුඹලා ගේ දුක, හා නුඹලා ගේ දිළිඳුකම නැති කරන්න අපට පුළුවනි.

## Widows by Ariel Dorfman

**වැන්දඹුවෝ**
**පරිවර්තනය- සිරිල් සී. පෙරේරා**
**චරිතය - සොපියා (කාන්තා)**

සොපියා: උඹේ දුව මගේ තාත්තාගේ මළමිනිය ගෙනියන්න ඉඩ දුන්න එක වැරදියි. ඒ වරදට උඹල කිසිම කෙනෙකුට මං සමාව දෙන්නෙ නෑ. ඇලෙක්සැන්ඩ්‍රා, උඹේ නහරවල උඹේ අම්මාගේවත්, තාත්තාගේවත්, ලේ බිඳක් නැහැ. නමුත් පිඩෙලියා (පිඩෙලියා අමතමින්) මං හිතුවා උඹ එමලියානෝ ගේ දුව කියා. නමුත් උඹට වත්, උඹල කිසිම කෙනෙකුට වත් කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ. මේ ගෙය හැදුවේ මගේ තාත්තා, උඹලා ගේ සීයා. නමුත් උඹලා මගේ තාත්තා ගේ මළ මිනිය තනි කර දමා මාර්කැට්ටුවට ගියා. උඹලාට පණ තියෙන මිනිස්සුයි, මැරිච්ච මිනිස්සුයි විකුණා ගෙන කන්න පුළුවනි. තොපි තරම් වල් බැල්ලියො, වල් වේසියෝ මේ මුළු ගමේ ම නැහැ................තොපි අර ගඟේ තියෙන ගල් වගෙයි. හිතක් පපුවක් නැහැ. අපි අපේ මැරිච්ච මිනිසුන්ගේ මළමිනි ගරු සරු ඇතිව අපේ සොහොන් බිමේ භූමදාන කරන තෙක් ඉර පායන්න දෙන්නෙ නැහැ. හඳ පායන්න දෙන්නෙත් නැහැ. හුළං හමන්න දෙන්නෙත් නැහැ. එතකොට තොපි තොපේ නැති වෙච්ච මිනිසුන් ගැන කල්පනා කරාවි. ඇලෙක්සැන්ඩ්‍රා කෝ තොගේ මිනිහා? මගේ පුතා, එමලියානෝ? යතිනා, කෝ මගේ පුතා අල්පොන්සු? අල්පොන්සු තොගේ මිනිහා නේද?

මොකක් ද තොගේ මිනිහට වුණේ? අතුරුදහන් වුණා නේද?......... කෝ අන්තෝනියෝ?...........කෝ තියෝ?......... කෝ ලුවිස්? කෝ රවුල්? පබ්ලෝ? හර්තාන්දෝ ක්ලෝඩියෝ? ජාකුවින්? එමලියානෝ ? එදිරෝදෝ? සවුල්? කෝ අන්දියස්? කාලෝස්? ලොරෙන්සෝ?......... කෝ මේ මිනිස්සු? මොකද උන්ට වුණේ? කෝ මිගෙල්? රොබෙටෝ ? මාරියෝ? සෙල්වදෝර්? එර්හැස්ටෝ.........

## Hamlet by William Shakespeare

**හැම්ලට්**
**පරිවර්තනය - බන්දුල විතානගේ**
**චරිතය - හැම්ලට් (පිරිමි)**

හැම්ලට්: ජීවත්වෙම්ද මියයම්ද, ඒකයි ප්‍රශ්නය. වඩා උදාරවන්නේ කුරිරු වාසනාවේ හී පහරින් සහ වෙඩි පහරින් දුක් විඳීමද? නැත්නම් කරදර සාගරයට විරුද්ධව අවිගෙන සටන් කිරීමෙන් ඒවා තුරන්කරලීමද? මැරෙනවා යනු නිදාගැනීමයි. ඊට වඩා දෙයක් නෑ. නිදාගැනිමෙන් අප කෙලවර කරන්නෙමු.

හද වේදනා සහ දහසක් චලන.

අප එය ආදරයෙන් ප්‍රාර්ථනය කරන්නෙමු.

මරණය යනු නිදා ගැනීමයි.

නිදා ගන්නවා යනු සමහර විට සිහින දැකීමයි. අන්න ඒක තමයි සහනය. මරණය නැමැති නින්දේදී අප දකින සිහින, අප මේ ජීවිතය ඉවතලුවාට පසුව අප මදක් නවතිමු. ඒකයි අප දුක් විඳීම එපමණක් දිග කලක් ඉවසන්නේ.

අප ජීවත්වන ලෝකයේ හිරිහැර කව්ද ඉවසන්නේ. පීඩකයාගේ අසාධාරණය, උඩඟු මිනිසාගේ කෲර භාවය ප්‍රේමය නොතැකීම, නීතියේ ප්‍රමාදය, පාලකයින්ගේ හිංසා සහ අපහාස අහිංසකයෝ පෙලති.

ඔහුට සියල්ල කිරිච්චියකින් පමණක් විසඳාලිය හැකිව තිබියදී?

ගොරවමින් වෙහෙසවී හතිලමින් කව්රු කරදරයේ මෘගයෙක් වෙයිද?

මරණයෙන් පසුව යම්කිසි දෙයක බියක් නොවන්නට ගිය කෙනෙක් ආපසු නොඑනා, කිසිවෙක් නුදුටු ලෝකය සිත අවුල් කරවයි......

එය අප පොළඹවයි දන්නා රට කරදර විඳදරා සිටීමට

නොදන්නා රටකට පියාඹා යනවාට වඩා?

අන්න ඒ නිසයි හෘද සාක්ෂිය අප නිවටයන් බවට පත් කරන්නේ.

**A Doll's House by Henrik Ibsen**

**බෝනිකි ගෙදර**

**පරිවර්තනය - සුනිල් විජේසිරිවර්ධන**

**චරිතය - නෝරා (කාන්තා)**

නෝරාඃ ඕගොල්ලන්ගෙ ලස්සන ! කම්මුල් ජම්බු වගේ රතු වෙලා.

**(නෝරා කතා කරගෙන යද්දී ළමුන්ද එකවර කතා කරති.)**

ඕගොල්ලො සෙල්ලම් කළාද? හරි ෂෝක් ! ඔයා එමියි බොබ්වයි හිම කරත්තෙ තියාගෙන ඇද්දා? දෙන්නවම එකට? මගෙ අම්මෝ, හරිම හපන් වැඩක්නෙ. අයිවර් ඔයා හරිම හපනෙක්. නැනී ඔන්න ඔය පුංචි බෝනික්කිව මට පොඩ්ඩක් දෙන්න. **(ඇය කුඩාම දරුවා ආයාගේ අතින් ගෙන වඩාගෙන වටේ කරකැවෙමින් නටයි.)** ඔව්, ඔව්, බොබ් එක්කත් අම්මා මෙහෙම නටනවා. හැබැට? ඕගොල්ලො හිම බෝලත් ගහ ගත්තා? අනේ මම එතන හිටියෙ නෑ නෙ. නෑ, නැනී ඔහොම ඉන්න අරින්න. මම ඒගොල්ලන්ගෙ ඇඳුම් ගලවන්නම්. මම ඒක ආසම වැඩක් නේ..... ඔයා හොඳටම හීතල වෙලා වගේ. අල්ලපු කාමරේ ස්ටෝව් එක උඩ අන්න උණු කෝපි ටිකක් ඔයාට තියලා ඇති.

**(ආයා වම් පස කාමරයට යයි. නෝරා දරුවන්ගේ ඇඳුම් පැළඳුම් ගලවමින් සී සී කඩ විසි කරයි. ළමයින් හැමෝම එකවර කතා කරමින් සිටිති.)**

නෝරාඃ හැබැටම! ලොකු බල්ලෙක් ඔයා පස්සෙ එලෙව්වා. ඒත් එයා හැපුවේ නෑ නෙ. ඔව්, බල්ලො මේ වගේ පුංචි බෝනිකි - බබාලව හපන්නෙ නෑ. අයිවර්, පාර්සල් දිහා බලන්න නම් බෑ. ඒවගෙ ඇතුළෙ තියෙන්නෙ මොනවද? හා, මං දන්නවා ඔයා ඒක දැනගන්න හොඳටෝම ආස විත්තිය. ඒයි, ඒයි අරින්නෙ නෑ, ඇඟට පනියි ඔන්න......, හරි, සෙල්ලම් කරන්න ඕන? මොනවද අපි එහෙනං කරන්නේ? හැංගිමුත්තං කරමුද? ආන්න හරි, අපි හැංගිමුත්තං කරමු. බොබ්, ඔයයි ඉස්සෙල්ල හැංගෙන්නෙ - මම? හා හොඳයි, මං හැගෙන්නංකො ඉස්සෙල්ලම.

**දිරිය මව හා ඇගේ දරුවෝ**

**හෙන්රි ජයසේන**

**චරිතය - දිරිය මව (කාන්තා)**

දිරිය මවː අනේ චැප්ලේන් - පොඩ්ඩක් මොලේ පාවිච්චි කරමු. තමුසෙ හොඳ මිනිහ. ඔහෙගෙ කර පිට මගෙ ඔලගු බර පටවන්ඩ මම කැමති නෑ - මට ඕනෑ කරන්නෙ මමයි, මගෙ දරු පැටවුනුයි මේ කරත්තෙන් එක්කම මේ යුද්දෙන් එගොඩ කර ගන්ඩ........මගෙ හිතේ කිසිම අදහසක් නෑ අමුතුවෙන් පුද්ගලික ජීවිතයක් පටන්ගන්ඩ! මේ මොහොතෙ උනත් බොහොම අවදානම් වැඩක් මම කරන්නේ. සේනාපතියෙක් වැටිල - යුද්දෙ ඉවර වෙන කතා බහ හැම තැනම තියෙද්දී මේ බඩු තොගයකුත් අරගෙන. හොඳයි මම නට්ටං උනොත් ඔහෙට යන කල මොකද්ද? කොහෙ යන්ඩද? පේනව නේද? ඔහෙට සාංකාවක්වත් නෑ - හැං ඔන්න ඔය දර ටික පළමු - හවස් සීතල ජාමෙ සීතල නැතුව ඉන්ඩ පුළුවනි එතකොට. ඒක කොච්චර ලොකු එකක් ද මේ වගෙ කාලෙක?

ඒ මොකක්ද?

**(ඇය නැඟී සිටියි බොහෝ සේ කැළඹී. හතිලමින්. කැත්රින් එයි. ඇගේ ඇසක් හා නළල ද වසා ලේ ගලන තුවාලයකි. නොයෙකුත් බඩු බාහිරාදිය ඈ පසුපස ඇදෙගෙන එයි නොයෙක් පාර්සල්, හම්බඩු, තම්මැට්ටමක් ආදිය)**

මේ මොකද? උඹට තුවාල කළාද කවුරු හරි? මගදි? එන අතරමග දරුවට තුවාල කරළ! කිසිම සැකයක් නෑ, අර මෙතන ඉඳගෙන මගෙ බීම බීලා වෙරිවුන සොල්දාදුව වෙන්ඩ ඕනෑ! අපරාදෙ මම උඹට යන්ඩ ඇරියෙ - පැත්තකට දමාපං ඔය බඩු ටික - නරක තුවාලයක් නෙමෙයි - හම විතරයි තුවාලවෙලා තියෙන්නෙ - මම වෙලන්නම් තුවාලෙ - සුමානයක් යන කොට ඕක සනීප වෙලා. මූං මුරුගයන්ට හපන්!

**(ඇය තුවාලය වෙලයි)**

**මුඩුක්කුවේ සුරඟන**
**පරිවර්තනය - මහාචාර්ය තිස්ස කාරියවසම්**
**චරිතය - ෂෙන් තේ (කාන්තා)**

ෂෙන් තේ මඟුල් ඇඳුමින් සැරසී සිටියි. ඇය තම මංගල්‍යයට යමින් සිටින අතරතුර

ෂෙන් තේ: භයානක වැඩක් වුණා නේ. යං සුන් එක්ක මා සාප්පුවෙන් පිට වුණත් එක්කම පරණ කපටි වෙළෙන්දාගෙ නෝනා පාරේ මං එන කං වෙවුල වෙවුල හිටිය දැක්කා. එයාගෙ මහත්තයට අමාරු වෙලා ඇඳේ. මට දුන්නු රිදී ඩොලර් දෙසීය ගැන හිත කරදර කර ගෙන. එය කිව්ව දැන් ආපහු ඒක දුන්නොත් හොඳා කියල. මං දෙන්නම් කියල මම කිව්ව. ඒ මනුස්සය කිව්වා මගේ මස්සිනා ෂුයි තා විශ්වාස කරන්න අමාරුයි, ඒ වගේම මං බඳින එක්කෙන යං සුනුත් වංචාකාරයා කියල. මේක ඇහුවම මගේ ඔළුව අවුල් වුණා. මං යං සුන් බඳා ගත්තා. ෂුයි තාට එයා කියපු දේවල් එකක්වත් ෂෙන් තේට පාඩමක් ඉගැන්නුවේ නෑ. ඒ මිනිහා බඳා ගෙන මං මටම කියා ගත්තා.

එක්ක යන්න මරුව සමග ඉඩ තියන්නෙ නෑ.

මිනිහෙක් හරි මිනී වලට යන්න ඕන නෑ.

හැම මිනිහම ඉන්න ඕන සන්තෝසෙන්.

මිනිහෙක් හරි ඉන්නව නම් සන්තොසෙන්.

කොච්චර හොඳ දෙයා...

මං කොහොමද ඒ නාකි ජෝඩුව අමතක කරන්නෙ? යං සුන් මං එක්ක ගියේ හුළඟට ගහ ගෙන ගියා වගේ. එය නරක මිනිහෙක්මත් නෙවී. එයා මට ආදරෙයි. එයා සිමෙන්ති පැක්ටේරියෙ වැඩට යාවී.

කෝම වුණත් පියඹන්න නම් සුන්ට පුදුම ආසාවක් තියෙනව. දැන් මේ මගේ මංගල්ලෙට යන ගමනුත්, මගෙ හිත දෙපැත්තට වැනෙනවා. එක පැත්තකින් සතුටුයි. ඒ වගේම බයයි.

**Character: Shen Te (Female)**

**Play: The Good Person of Setzuan by Bertolt Brecht**

*(Shen Te comes down the street carrying a dish of rice.)*

SHEN TE: (to the audience). I've never seen the town in the early morning before. At this hour I used to lie in bed with a dirty blanket over my head, afraid of waking up. Today I walked among the newspaper boys, among the men who rinse the pavement with water, and among the ox carts that bring fresh vegetables from the country. I've walked a long way from Sun's neighborhood over here, but I've been getting merrier at every step. I've always been told that if you're in love you walk on clouds, but the best thing is walking on the earth, on the pavement. I tell you, in the morning rows of houses look like rubbish heaps with lights on them. The sky is pink and transparent because there's no dust yet. I tell you, you miss much if you don't love, if you don't see your Setzuan at the hour when it rises from sleep like a sober old craftsman pumping his lungs full of fresh air and reaching for his tools, as the poets say. (To the waiting people) Good morning! Here's the rice! (She distributes the rice, then notices Wang.) Good morning, Wang. I'm quite light-headed today. On the way home I looked at myself in every shop window, and now I feel like buying a shawl. (After hesitating a little) I'd so much like to be beautiful.

**Character: Tom (Male)**
**Play: The Glass Menagerie by Tennessee Williams**

TOM:
I didn’t go to the moon. I went much further–for time is the longest distance between two places. Not long after that I was fired for writing a poem on the lid of a shoebox. I left St. Louis. I descended the steps of the fire escape for a last time and followed, from then on, in my father’s footsteps, attempting to find in motion what was lost in space. I traveled around a great deal. The cities swept about me like dead leaves, leaves that were brightly coloured but torn away from their branches. I would have stopped, but I was pursued by something. It always came upon me unawares, taking me altogether by surprise. Perhaps it was a familiar bit of music. Perhaps it was only a piece of transparent glass. Perhaps I am walking along a street at night, in some strange city, before I have found companions. I pass the lighted window of a shop where perfume is sold. The window is filled with pieces of coloured glass, tiny transparent bottles in delicate colours, like bits of a shattered rainbow. Then all at once my sister touches my shoulder. I turn around and look into her eyes. Oh Laura, Laura, I tried to leave you behind me, but I am more faithful than I intended to be! I reach for a cigarette, I cross the street, I run into the movies or a bar, I buy a drink, I speak to the nearest stranger–anything that can blow your candles out! For nowadays the world is lit by lightning! Blow out your candles, Laura – and so goodbye…

# සහතික පරීක්ෂාව සඳහා ඇගයුම් නිර්ණායක

| පරීක්ෂණය සිදු කරන ක්‍රමවේදය | ඇගයීම් නිර්ණායක | ඇගයීම් විස්තරය | ලකුණු ලබාදීමේ ක්‍රමවේදය | ලකුණු |
|---|---|---|---|---|
| සහතික පත්‍ර පරීක්ෂාව | විද්‍යාර්ථීන්ගේ ජාතික, අන්තර්ජාතික ජයග්‍රහණ සහ රජය පිළිගත් සය මසකට නොඅඩු වූ පාඨමාලාවලින් ලබා ගත් ඇගයීම | ජාතික, අන්තර්ජාතික වශයෙන් ලබාගත් විෂයානුබද්ධ සහ වෙනත් ජයග්‍රහණ හෝ රජය පිළිගත් ආයතනයකින් සය මසක් තුළ අවසන් කළ පාඨමාලා පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු විශ්වවිද්‍යාලය විසින් ඔබට ලබා දෙන ලද ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කරන්න.<br><br>ඔබ විසින් උසස් පෙළ හදාරන ලද වර්ෂයේ සිට පෙර වසර තුනක් ඇතුළත හෝ උසස් පෙළ විභාගයට ඉදිරිපත් වීමෙන් අනතුරුව දිනාගත් පදක්කම්, සම්මාන සහ සහතික පත්‍ර පමණක් ඇගයීමට ලක් කෙරේ. | අන්තර්ජාතික මට්ටමේ ජයග්‍රහණ (ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සහ සහභාගි වීම) | 03 (එකකට ලකුණු 03 බැගින්) |
| | | | ජාතික මට්ටමේ ජයග්‍රහණ | |
| | | | ප්‍රථම ස්ථානය | 02 (එකකට ලකුණු 02 බැගින්) |
| | | | දෙවන ස්ථානය | 01 (එකකට ලකුණු 01 බැගින්) |
| | | | තෙවන ස්ථානය | 0.5 (එකකට ලකුණු 0.5 බැගින්) |
| | | | උසස් ඩිප්ලෝමා (එක් අවුරුදු හෝ ඊට වැඩි) | 02 (එකකට ලකුණු 02 බැගින්) |
| | | | ඩිප්ලෝමා (සය මාසික හෝ වැඩි)<br><br>(ජාතික නැටුම්, නාට්‍ය, සංගීත විභාගය අවසාන සහතිකය, භාත්කණ්ඩ සංගීත, නැටුම් විභාගය විශාරද සහතිකය) | 01 (එකකට ලකුණු 01 බැගින්) |